# පනාවිටිය අම්බලම පිලිබඳ වාස්තුවිද්‍යාත්මක හා ඓතිහාසික අධ්‍යයනයක්

එස්.පී.සී. සේනාධීර [40]

---

අතීතයේ පටන් ගෘහ නිර්මාණ ශිල්පය ලාංකික නිර්මාණකරුවන් සමාජයේ විවිධ කාර්යන් සපුරා ගැනීමට ඉවහල් කරගෙන තිබේ. විසුම්හල් වෙදහල් ඉසිඹුහල් මෙකී පරමාර්ථය කියාපාන මහගු කැඩපතකි. මෙම අධ්‍යයනයට මූලික වන පනාවිටිය අම්බලම ද මෙවන් උසස් නිර්මාණයක් ලෙස සඳහන් කළ හැකි ය. මෙම උත්කෘෂ්ට නිර්මාණය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනාවිටිය නම් සුන්දර ගම්පියසේ ස්ථානගත වී ඇත. වංස කතාවලට අනුව බෝසත් විජයබා කුමරුට කැරලිකරුවකු විසින් නාගවිෂ පෙවූ හීයක් විදි අතර සිහි මුර්ජා වූ කුමරුගේ ප්‍රාණය මෙම ගම අසල රත්මල් වැටියේදී නැවත පැමිණි අතර **පණ+ආ+වැටිය** පසුකාලීනව පනාවැටිය ලෙස ජනවහරට එක්ව තිබේ. දෙස් විදෙස් ගෘහනිර්මාණ ශිල්පීන් කැටයම් කරුවන් මවිතයට පත්කළ අසහය නිමැවුමක් වූ මෙම ගිමන් හලෙහි ලී කණු බාල්ක යටලී හා කැටයම් නිර්මාණ දෙවැනි වන්නේ ඓතිහාසික ඇම්බැක්කේ දේවාලයට ත් ශ්‍රී දළදා මාළිගාවටත් පමණක් බව ඉතිහාසඥයින්ගේ මතයයි. මෙය 1961 දී පුරවිද්‍යා කොමසාරිස් චාල්ස් ගොඩකුඹුර මහතාගේ අධීක්ෂණයට ලක්ව තිබේ. රජරට ශිෂ්ටාචාරය තුළ ඉදිකළ නිර්මාණ වලට වඩා රජධාණි නිරිතදිගට විතැන් වීමේදී යම් වාස්තුවිද්‍යානුකූල හා උවදුරු වලට මුහුණදිය හැකි අයුරින් අම්බලම් ගිරිවිහාර ටැම්පිට විහාර ඉදිකළ බව පෙනේ. මෙම පනාවිටිය අම්බලම නිර්මාණය සඳහා යොදාගත් අමුද්‍රව්‍යය තාක්ෂණය මෙන්ම කලාත්මක බව පිළිබඳව ද අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අභිප්‍රායයි. එමෙන්ම මෙහි කැටයම්ද අද්විතීය ස්ථානයක් හිමි කර ගනියි. මෙම කැටයම් අතර පහතරට නැටුම්, අණබෙරකරුවන්, බෝපත් ,නෙළුම් මල් ,මුවන් සිංහයන් යනාදිය ප්‍රමුඛ වේ.මෙම අධ්‍යයනය සඳහා පුස්තකාල ගවේෂණය ක්ෂේත්‍ර අධ්‍යයනය සම්මුඛ සාකච්ජා පැවැත්වීම සහභාගිත්ව නිරීක්ෂණය සිදුකිරීම යනාදී ක්‍රමවේද යොදා ගන්නා ලදි. එමෙන්ම මෙහි ඇති කැනිමඩල හා කලාත්මක අංග ප්‍රධාන වශයෙන් මූලික අධ්‍යයන වලදී හඳුනාගත් දත්ත ලෙස දැක්විය හැකි ය. මෙම දත්ත පිළිබඳව තවදුරටත් තහවුරු කිරීමට ද මෙමඟින් බලාපොරොත්තු වේ. ඉතිහාසය මෙන්ම සොබාදහම විසින් ද අතීතයේ සරතැස නිවූ මෙම ඉසිඹුහල මතුපරපුර උදෙසා ආරක්ෂා කොට දී ඇත්තේ ය. මෙම අධ්‍යයනය තුළින් එයින් මතුවන සුවිශේෂීභාවය සමාජයට පෙන්වා දීම හා එහි ආරක්ෂාව තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ ඉසිඹුහලක කැණිමඩල, තාක්ෂණය

---

[40]පුරාවිද්‍යාහා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. chamalsenadeera24@gmail.com